# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1982 අංක 49 දරන ජාතිය ගොඩනගන්නන්ගේ සංගමය (සංස්ථාගත) කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල: ශත 45 යි    තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1982 අංක 49 දරන ජාතික ගොඩනගන්නන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 41/82.

## ජාතික ගොඩනගන්නන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ජාතික ගොඩනගන්නන්ගේ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබූයේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

**1.** මේ පනත 1982 අංක 49 දරන ජාතික ගොඩනගන්නන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික ගොඩනගන්නන්ගේ සංගමය සංස්ථාගත කිරීම.

**2.** (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ගොඩනගන්නන්ගේ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ද, මේ පනතේ ආරම්භය වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතික ගොඩනගන්නන්ගේ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර, එම සංස්ථාපිත නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකිය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මහජනයාගේ උද්යෝගය, දක්ෂතා සහ ස්වේච්ඡාත්මක උත්සාහය ඔවුන්ගේම වැඩි දියුණුව සඳහා උපයෝගී කොට ගෙන එමගින් ගමේ සංවර්ධනය සහ අවශ්‍යතාවයේ දී ජාතියේ උන්නතිය සාක්ෂාත් කර ගැනීම;

(ආ) සංවර්ධන කටයුතුවල යෙදී සිටින ස්වේච්ඡා සංවිධාන පිළිගැනීම, එම සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ හැකි අවස්ථාවල දී ඒ සංවිධානවල ක්‍රියාකාරීත්ව සම්බන්ධීකරණය කිරීමට උපකාර කිරීම;

(ඈ) ආත්ම විශ්වාසය නංවාලන ක්‍රියාකාරිත්ව මෙකරෙහි වැඩි සැලකිල්ලක් දක්වමින් විශේෂයෙන් ග්‍රාමීය අංශය පදනම් කර ගත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, එම ව්‍යාපෘති සඳහා අවශ්‍ය සම්පත් ලබා ගැනීම හා ක්‍රියාත්මක කිරීම ;

(ඇ) දුප්පත් ග්‍රාමීය ජනතාවට ලබා ගත හැකි ආධාර වඩා හොඳින් ලබා දීම සහ ජනතාව අතර පවත්නා තාත්වික ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් රාජ්‍ය පරිපාලන අංශයට ලබා දීම අරමුණු කොට ගෙන, දුප්පත් ග්‍රාමීය ජනතාව සහ රාජ්‍ය පරිපාලන අංශ අතර වඩා කිට්ටු සම්බන්ධතාවක් ඇති කිරීම ;

(ඉ) ග්‍රාමීය කණ්ඩායම්වලට ලබාගත හැකි ආධාර වඩා හොඳින් ලබා දීම සහ ජනතාව අතර පවත්නා තාත්වික ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ලබා දීම අරමුණු කොට ගෙන, ග්‍රාමීය කණ්ඩායම් පිහිටුවීමට ධෛර්ය දීම සහ ඒ හා සමාන කාර්ය ඉටු කරන සංවිධාන අතර සන්නිවේදන මාර්ග සහ සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම සහ ඒ සමාන ප්‍රශ්න වලට මුහුණ දීම ;

(ඊ) පිටස්තර අභ්‍යාස මධ්‍යස්ථාන, පවත්නා පාඨශාලා, අධ්‍යයන කණ්ඩායම් සහ සාකච්ඡා සම්මේලන හා වැඩ සම්මේලන වැනි වෙනත් සාමූහික අධ්‍යාපනික ක්‍රියාකාරකම් මගින් (සමාජ, සංස්කෘතික සහ අධ්‍යාත්මික මෙන් ම විද්‍යාත්මක හා තාක්ෂණික) උචිත අධ්‍යාපනික වැඩ සටහන්වලට ධෛර්යදීම, ඒවා වැඩි දියුණු කිරීම සහ පවත්වා ගෙන යාම ;

(උ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් යම් කිසි පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීමට හිතකර හෝ ආනුෂංගික අනෙකුත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදාන යන් සහ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සේවක පිරිස් නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදීමේ ද බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

5. (1) සංස්ථාවේ කටයුතු, නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් විසින් සංස්ථාවේ ඒ රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේදී ධුර දරන සංගමයේ පාලක මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය විය

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවට සාමාජිකයන් ඇතුළත් කිරීම, ඉන් ඔවුන්ගේ ඉවත්වීම හා විශ්‍රාම ගැනීම හෝ ඔවුන් පහකිරීම සඳහා ද සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු, එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඊට නමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු මුදල් සංස්ථාව විසින් ගෙවිය යුතු බව හා සංගමයට අයවිය යුතු මුදල් සංස්ථාවට ගෙවිය යුතු බව.

7. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පවත්නා වූ සංගමයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර සංගමයට අය විය යුතු සියලු ණය, හා ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ ආදායම් සහ දේපළ යෙදවීම.

8. සංස්ථාවේ ආදායම සහ දේපළ හුදෙක් සංස්ථාවේ පරමාර්ථ නංවාලීම පිණිසම යොදා ගත යුතු අතර ඉන් කිසිම කොටසක්, සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද මුදල් හෝ වෙනත් ලාභ විශයෙන්, කෙළින් ම හෝ අනායාසාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද මේ වගන්තියේ විධිවිධාන මගින්—

(අ) සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ සංස්ථාවේ යම් සාමාජිකයකුට, සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ගෙවීම;

(ආ) ණයට දෙන ලද මුදලක් වෙනුවෙන් පවතින වාර්ෂික බැංකු පොලී ප්‍රමාණය නොඉක්මවන ප්‍රමාණයක් අනුව පොලී ගෙවීම හෝ සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක ප්‍රාග්ධනයෙන් සියයෙන් එක් කොටසක් නොඉක්මවන කොටස් දරන සාමාජිකයකු වන අවස්ථාවක ඒ සමාගම විසින් සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ සහ නිසි කුලියක් ගෙවීම;

(ඇ) තම කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමෙහිලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහි ලා, සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් දරන ලද වියදම් ගෙවීම

වලක්වනු නොලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

9. යම් මිළට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියෝගයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා ද සංස්ථාවේ රීතිවලට යටත්ව ද උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් ඒ දේපළ දැරිය යුතු ය.

**සංස්ථාවේ සාමාජිකයන්ගේ වගකීම.**

10. යම් සාමාජිකයකුගෙන් සංස්ථාවට අය විය යුතු යම් වාර්ෂික දායක මුදලක ප්‍රමාණය සහ රුපියල් දහයකට වැඩි නොවූ අතිරේක මුදල් ප්‍රමාණයක් ද ඉක්ම වූ යම් සම්මාදම් මුදලක්, සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා නිදහස් කිරීම සඳහා ගෙවීමට සංස්ථාවේ කිසිදු සාමාජිකයෙක් බැඳී නැත්තේ ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන වග.**

11. සංස්ථාවේ පාලක මණ්ඩලයේ යෝජනා සම්මතයක බලය යටතේ සහ පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා අතුරෙන් එක් තැනැත්තකු පාලක මණ්ඩලයේ ලේකම්වරයා හෝ පාලක මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා පත් කරනු ලැබූ වෙනත් තැනැත්තකු විය යුතු අතර ඔවුන් පැමිණ සිටිය බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.**

12. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලුම ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කරනු ලැබීමෙන් පසු, කවර වූව ද දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදාදීම ස්වකීය රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හරින වේලාවේ දී හෝ ඊට පෙරාතුවම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කළ යුතු ය. එසේ කිරීම පැහැර හරින ලද අවස්ථාවක දී ඒ දේපළ හෝ ඉන් යම් කොටසක් දරන හෝ පිහිටි ප්‍රදේශය විෂයයෙහි සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් ඒ සංගමය හෝ සංගම් කවරේදැයි තීරණය කළ යුතු ය. ඒ දේපළ හෝ ඉන් යම් කොටසක් මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර නියෝජනය කළ නොහැකි වේ නම්, ඒ දේපළ හෝ ඒ කොටස යම් පුණ්‍ය කටයුත්තක් සඳහා යෙදවිය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

13. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් එවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.